මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

දිනය 2026.11.16

ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2026 ඔක්තෝබර්


2026 ඔක්තෝබර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි

නිෂ්පාදන අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2026 ඔක්තෝබර් මාසයේ දී 55.3ක දර්ශක අගයක් වාර්තා කරමින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කළේය. සියලුම උප දර්ශක කඩඉම් මට්ටමට වඩා ඉහළ අගයන් වාර්තා කරමින් මෙම වර්ධනය සඳහා ධනාත්මකව දායක විය.

නව ඇණවුම් උප දර්ශකයේ දක්නට ලැබුණු කැපී පෙනෙන ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන සහ ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශවල වසර අවසාන උත්සව සමය ආශ්‍රිතව පවතින ඉල්ලුම හේතු විය. තවද, ඔක්තෝබර් මාසයේ දී නිෂ්පාදන උප දර්ශකය ඉහළ යෑමට රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ දක්නට ලැබුණු වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, නව ඇණවුම් සහ නිෂ්පාදනවල වර්ධනයට සමගාමීව සේවා නියුක්ති සහ තොග මිලදී ගැනුම් උප දර්ශක ද වර්ධනය විය. මේ අතර, නිෂ්පාදන යෙදවුම් සඳහා පැවති ඉල්ලුම ඉහළ යාම පිළිබිඹු කරමින්, ඇණවුමක් සැපයීම සඳහා සැපයුම්කරුවන්ට ගතවන කාලය තවදුරටත් ඉහළ ගියේය.



නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය

විචල්‍යය	2026 සැප්.	2026 ඔක්.	+/-	දිශානතිය
නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය	**53.0**	**55.3**	**+**	**වැඩි වේගයකින් ඉහළ යෑමක්**
නව ඇණවුම්	51.0	55.0	+	වැඩි වේගයකින් ඉහළ යෑමක්
නිෂ්පාදන	51.0	52.2	+	වැඩි වේගයකින් ඉහළ යෑමක්
සේවා නියුක්තිය	52.6	51.1	-	අඩු වේගයකින් ඉහළ යෑමක්
තොග මිලදී ගැනුම්	50.0	56.1	+	කඩඉම් මට්ටමේ සිට ඉහළ යෑමක්
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය	63.0	66.1	+	වැඩි වේගයකින් ඉහළ යෑමක්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

එළඹෙන උත්සව සමයේදී ඉල්ලුම ඉහළ යනු ඇතැයි පවතින අපේක්ෂාවන් හේතුවෙන්, ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා ධනාත්මක මට්ටමක පවතී.

ගෝලීය ප්‍රවණතා
නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

රට / කලාපය	දිශානතිය
ගෝලීය	අඩු වේගයකින් ඉහළ යෑමක්
ඉන්දියාව	අඩු වේගයකින් ඉහළ යෑමක්
චීනය	අඩු වේගයකින් ඉහළ යෑමක්
එක්සත් ජනපදය	අඩු වේගයකින් ඉහළ යෑමක්
එක්සත් රාජධානිය	වැඩි වේගයකින් ඉහළ යෑමක්
යුරෝපා කලාපය	අඩු වේගයකින් ඉහළ යෑමක්

මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 නොවැ. 16 වන දිනට (PMI Releases (spglobal.com))

[1] *එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2026 ඔක්තෝබර් මාසයේදී 62.5ක දර්ශක අගයක් වාර්තා කළ අතර, එමඟින් පෙර මාසයට සාපේක්ෂව සේවා අංශයේ ක්‍රියාකාරකම් වැඩි වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)

2026 ඔක්තෝබර්

62.5

ව්‍යාපාරික ක්‍රියාකාරකම් ප්‍රසාරණය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් වෙනත් පුද්ගලික සේවා අංශයේ සිදු වූ වැඩිදියුණු වීම් හේතු විය. මූල්‍ය සේවා සහ භාණ්ඩ ප්‍රවාහන සේවා අංශවලින් ද ඊට සැලකිය යුතු දායකත්වයක් ලැබිණි.

නව ව්‍යාපාරවල වර්ධනයක් වාර්තා වූ අතර, ඒ සඳහා මූල්‍ය සේවා සහ වෙනත් පුද්ගලික සේවා අංශවල සිදු වූ ප්‍රසාරණය ප්‍රමුඛ දායකත්වයක් ලබා දුන්නේය . නවාතැන් පහසුකම්, ආහාර හා පාන වර්ග සැපයීමේ සේවා සහ භාණ්ඩ ප්‍රවාහන සේවා අංශ ද මෙම ධනාත්මක වර්ධනයට දායක විය.

වැඩිවන මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා උප-අංශ කිහිපයක සමාගම් සිදු කළ නව සේවක බඳවාගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය ඉහළ ගියේය. මේ අතර, නිම කිරීමට ඉතිරිව ඇති කාර්යයන් ප්‍රමාණය පෙර මාසයට සාපේක්ෂව වැඩි වේගයකින් පහළ ගියේය.


සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය

විචල්‍යය	2026 සැප්.	2026 ඔක්.	+/-	දිශානතිය
සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)	**60.5**	**62.5**	+	**වැඩි වේගයකින් ඉහළ යෑමක්**
නව ව්‍යාපාර	60.9	59.8	-	අඩු වේගයකින් ඉහළ යෑමක්
සේවා නියුක්තිය	54.0	56.1	+	වැඩි වේගයකින් ඉහළ යෑමක්
නිම කිරීමට නියමිත කාර්යයන්	49.4	48.1	-	වැඩි වේගයකින් පහළ යෑමක්
අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්	76.2	74.7	-	අඩු වේගයකින් ඉහළ යෑමක්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ධනාත්මක මට්ටමක පැවති අතර, හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්, සංචාරක පැමිණීම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කිරීම සහ ඉදිරියේ දී එළඹෙන උත්සව සමය මෙයට දායක විය. කෙසේ වෙතත්, පවතින ගෝලීය අවිනිශ්චිතතා හේතුවෙන් ඉදිරි දැක්ම කෙරෙහි අහිතකර අවදානම් අඛණ්ඩව පවතී.

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
(ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගෝලීය ප්‍රවණතා

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

රට/ කලාපය	දිශානතිය
ගෝලීය	**අඩු වේගයකින් ඉහළ යෑමක්**
ඉන්දියාව	**වැඩි වේගයකින් ඉහළ යෑමක්**
චීනය	**අඩු වේගයකින් ඉහළ යෑමක්**
එක්සත් ජනපදය	**අඩු වේගයකින් ඉහළ යෑමක්**
එක්සත් රාජධානිය	**වැඩි වේගයකින් ඉහළ යෑමක්**
යුරෝපා කලාපය	**අඩු වේගයකින් ඉහළ යෑමක්**

මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 නොවැම්බර් 16 වන දිනට

තාක්ෂණික සටහන:

ක්‍රමවේදය

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සම්මිෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුම්ක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

දර්ශකය

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවති ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

නියැදිය

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්

සේවා නියුක්තිය	: සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන
ගැනුම් තොගය	: නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය
ඇණවුම්ක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය	: සැපයුම්කරුවෙකුට ඇණවුම්ක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය
නිම කිරීමට නියමිත කාර්යයන්	: නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.